සමාජයේ චින්තනය හැඩගැස්වීම සඳහා භාෂාවේ බලපෑමත්, එම භාෂාව හැඩගැස්වීම සඳහා මාධ්‍ය ඔස්සේ ලැබෙන දායකත්වයත් නොසලකා හැරිය නොහැක. ඒ අනුව ගත් විට, සෘණාත්මක සන්දර්භයන් තුළ ඇතැම් වෘත්තීන් හි නියැළෙන්නවුන් හැඳින්වීම සඳහා යොදාගැනෙනා අපහාසාත්මක ස්වරයකින් යුතු යෙදුම් මාධ්‍ය තුළ භාවිත වීම කෙතරම් යෝග්‍ය වන්නේ දැයි පාඨක අප ඇසිය යුතු පැනයයි.

පුවත්පත් තුළ ඇතැම් විට දක්නට ලැබෙන "කොන්දා", "ග්‍රාමයා" හෝ "ගුරා" වැනි යෙදුම් ඊට උදාහරණ වේ.

මව්බිම පුවත්පතේ (මාර්තු 09, 2022) බස් රථ අනතුරක් පිළිබඳව වූ පුවත් වාර්තාවක උපසිරස් තලය තුළ, බසයේ කොන්දොස්තරවරයා පිළිබඳව සඳහන් කිරීමට "කොන්දා" යනුවෙන් යෙදී තිබිණි.

ඔබ සිතනා ලෙසට,

1) යම් වෘත්තියක නියැළෙන්නෙකු මෙසේ සෘණාත්මක සන්දර්භයන් තුළ ලේබල් ගත කිරීම ඔස්සේ, පොදුවේ එම වෘත්තිය පිළිබඳව ඒකාකෘතික වීමක් සිදු නොවන්නේ ද?

2) ඒ ඔස්සේ එම වෘත්තිය පිළිබඳව සමාජය තුළ කොන් කිරීමේ ආකල්පයක් ඇති නොවන්නේ ද?

ඔබේ අදහස?